

Peter O'Toole as T. E. Lawrence in Lawrence of Arabia

# Lawrence of Arabia

## Oscar-winning film with no women

The only Oscar-winning film that has no speaking parts for women is **Lawrence of Arabia** directed by the veteran British film director, **Sir David Lean**. The only female in the entire film is a camel named Gladys. The epic film, about the life of T.E.Lawrence, a British military officer renowned especially for his liaison during the Arab Revolt of 1916-18.

The film was made in 1962 which included a cream of well - known artistes such as Aleck Guiness, Anthony Quinn, Omar sheriff, Jack Hawkins, Anthony Quayle and Peter O'Toole who portrayed the character of Lawrence. The film won 7 Academy Awards, 4 BAFTA awards, 5 Golden Globe Awards and many other international awards including the best film and the best director.

## ගැහැණු නොමැති සම්මාන දිනූ චිත්‍රපටය

බ්‍රිතාන්‍ය මහා සිනමාකරු සර් ඩේවිඩ් ලීන් 1962 දී නිර්මාණය කළ **ලෝරන්ස් ඔෆ් ඇරේබියා** චිත්‍රපටය කිසිදු ගැහැණු චරිතයක් නැති, ඇකඩමි සම්මාන ඇතුළු ජාත්‍යන්තර සම්මාන රැසක් දිනූ චිත්‍රපටය ලෙස සැලකේ. එහි රඟපෑ එකම ගැහැණු සතා නම් ග්ලැඩිස් නමැති ඔටු දෙනෙකු පමණි. ලෝරන්ස් ඔෆ් ඇරේබියා කතාව ගෙතී ඇත්තේ පළමුවන ලෝක යුද සමයේ මැදපෙරදිග ඉංග්‍රීසි හමුදාවේ සිටි සම්බන්ධතා නිලධාරියා වන **ටී. ඊ. ලෝරන්ස්ගේ** චරිතය පසුබිම් කරගෙනය. මෙහි ලෝරන්ස්ගේ චරිතයට පණ පෙව්වේ කීර්තිමත් අයිරිෂ් ජාතික නළුවෙකු වන පීටර් ඔටූල් ය. ඕමාර් ෂෙරීෆ්, සර් ඇලෙක් ගිනස්, ජැක් හෝකින්ස්, ඇන්තනි ක්වීන්, ඇන්තනි ක්වේල් වැනි ප්‍රකට සිනමා ශිල්පියෝ රැසක් ද එහි රඟපෑහ.

## සුනාමියට වසර 5 ක් පිරේ






**2004** දෙසැම්බර් **26** වෙනි දින ඉන්දියානු සාගරයේ වෙරළ සීමාවේ රටවල් රාශියකට බලපෑ සුනාමිය නිසා මුහුද ගොඩගලා මහා ජන සමූහයක් ජීවිත ක්ෂයට පත්වූහ. ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය ගණන් බලා ඇති අන්දමට රටවල් **13** කට අයත් **226000**ක් සෙනඟකගේ ජීවිත විනාශ විය. ඉතා තදබල ලෙස සුනාමියට ගොදුරුවූ රට-වල් නම් ශ්‍රීලංකාව, ඉන්දියාව, ඉන්දුනීසියාව හා තායිලන්තයයි. ශ්‍රීලංකාවේ පමණක් මියගිය ගණන **35,000** කි. සෙනග දස ලක්ෂයකට උන්හිටි තැන් නැතිවිය. අබලන් වූ සහ සහ මුලින් විනාශ වී ගිය ගෙවල් ලක්ෂයකට වඩා අධිකය. ශ්‍රීලංකාවේ මියගිය ප්‍රමාණයෙන් 10000ක් අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ වෙරළබඩ ජීවත්වූ වැසියෝ වූහ.

කිසිදාක නොසිතූ විරූ මෙම අති විශාල ආපදාවෙන් අනාථ වූවන්ට නිවාස ඉදිකිරීම් සහ අනෙක් සහන සැලසීම් කටයුතු සඳහා යන වියදම රුපියල් බිලියන 330 ක් යයි ගණන් බලා ඇත. සුනාමි ව්‍යසනයෙන් අනතුරුව යළි ජාතිය ගොඩනැඟීම් කටයුතු කඩිනම් කිරීම සඳහා වෙනම ආයතනයක් ශ්‍රීලංකා රජය මගින් පිහිටුවන ලදී. ඊට ජාත්‍යන්තර සංවිධාන වලින් සහ එක්සත් ජාතීන්ගේ මණ්ඩලයෙන් ආධාරද ලැබුණි. මුලින් කඩිසරව වැඩ කෙරීගෙන ආවත් ඒ ගොඩ නැඟීම් කටයුතු විවිධ හේතූන් නිසා හරිහැටි ක්‍රියාත්මක වූයේ නැත. තම ගෙවල් දොරවල් අහිමි වූ බොහෝ දෙනෙකුට තවම ගෙයක් ලැබී නැත. ඔවුන් තවමත් කඳවුරු වල වෙසෙන බව ලැබෙන පුවත් වලින් පෙනේ. ගෙවල් සෑදීම සඳහා අවශ්‍ය ඉඩම් ඒ ඒ පළාත්වලින් සොයා ගැන්ම අසීරුවීම ද ප්‍රශ්නයකි.

සුනාමි ව්‍යසනයට පසුගිය මාසයේ 26 වෙනිදිනට අවුරුදු 5 ක් සම්පූර්ණ වුණි. බොහෝ දෙනාට දැන් සුනාමිය ද මුළු-මනින්ම අමතකය. එහෙත් නැසී ගිය ඥාතීන් වෙනුවෙන් සිහි කිරීම්, දානමාන දීම් සහ පින් පැමිණවීම් රාශියක් ශ්‍රීලංකාවේ ව්‍යසනයට පත් ප්‍රදේශවල වීය. ඒ වියෝවූවන් වෙනුවෙන් කඳුළු සලන පිරිස් තවමත් එහි සිටිති.

## කවි කොළය



## ගිරා පෝතක වස්තුව!

නැවියෙකු මැක්සිකන් හාබර් එකක සිටී
දැඩි කළ ගිරා පොව්වා සෙල්ලමට වැටී
බාසා තුනක් දත්තෙකි සිටි වියෙහි පැටී
ඌ රන් පවුම් විසිදහසක් පමණ වටී

ගිරවා ලතින් වචනද ඇද නැතුව කියයි
පියනෝවකට අත්තටු ඇන ජයට වයයි
ඔපරා ගීත හතරක් තාලයට ගයයි
එමගින් ඩොලර් සීයක් දවසකට හොයයි

නිළියෝ ලීස් ටේලර් වැනි දිලෙන තිරේ
වැටුණෝ ගිරා පොව්වා පිළිබඳව පොරේ
ඌ දැක ගනුව යන යන තැන සෙනග පිරේ
දවසට වරක් වටිනාකම දෙගුණ කෙරේ

අවසානයේ ගිරවා ගැන සිහින මවා
සිටි එක් තරුණ නළුවෙක් පණවුඩය යවා
නැවියා ළඟට ගෙන්වා විසි දහස ගෙවා
ගිරවා ලබා ගත්තා තද පවස නිවා

දුර ගොවිපලක ඔහුගේ මව තවම හිඳී
ඇයගේ උපන්දින ඇත පසු දිනට යෙදී
දරුවෝ ඇගේ පණ මෙන් සිය මවට ලැදී
පිදුවෝ රන් රිදී මිණිමුතු තිළිණ පොදී

නැගණිය කෝටිපතියෙකුගේ බිරිඳ වුණ
මව වෙත යැවූ කැඩිලැක් රිය පරද වන
කිසියම් තෑග්ගක් පිළිබඳ සිතන තැන
ආවේ ගිරා පොව්වා මතකයට පැන

පසුදා හදිසි ගමනක් යා යුතුය තමා
මව වෙත ගියොත් එගමන විය හැකිය පමා
නළුවා අන්තිමේ ඉල්ලා මවගෙ සමා
ගිරවා යැවී රන්මය කූඩුවක දමා

නළුවා ගෙදර රෑ ආපසු පැමිණ එදා
සිය මව මතක් වී යන්නට පළමු නිදා
ඇය ඇමතුවා ටෙලිපෝනය රැගෙන බදා
කොහොමද මගේ ගිරවා මම එවපු මෙදා

" අන්තිම අගෙයි බර
අඩුවූ නමුදු සතා
ජීවිතයටම කෑ
රසවත් මසය ඉතා "
ඇය පැවසුවා " ආයෙත්
එන විටදි ඔතා
තව ජෝඩුවක් ගෙන
එන්නට බැරිද? පුතා ! "



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka




**ඉරිදා** - මේ සැරේ දිනපොත පිරෙන්නම ලියන්න දේවල් **SUN** දැන් ලංකාවෙ සිද්ධ වෙනව මේ ජනපතිවරණය නිසා. කියන්නත් ලැජ්ජයි ලංකාවෙ තත්වෙ අන්තිම සවුත්තුයි. දැන් හරියට අපේ රටේ ඇඳුම් සේරම ගැලෙව්වා වගේ මෙහේ ඉන්න අපිට හැඟෙනවා. සිංහළ ජාතියම රෙදි සේරම ගලවලා හෙළුවෙන් වහළක් උඩට නැග්ගුවා වගේ දැන් මුළු ලෝකෙටම පේනවා. ලැජ්ජාව කියන්න වචන නැහැ. අපේ සේරම මිනිස්සු කුලල් කාගන්නවා. දෙමළ ඩයස්පෝරාවයි, ලෝකෙ අනික් රටවලුයි විනෝදෙන් බලාගෙන ඉඳන් අත්පුඩි ගහනවා, මේ මඩේ බැහැලා දඟලන සිංහළයො දිහා. කෝ අර දිනපු යුද්දෙ තේජස? මාස හයකින් ඒ සේරම වතුරෙ හේදිලා ගියා. කැතරින් පුංචි අම්මා කියල එව්වා, දුවේ තව සුනාමියක් ආව වගේ තමයි කියලා. පුදුම කාලකණ්ණිකමක් !

**සඳුදා** - මේ දවස්වල ලංකාවෙ රූපවාහිනියයි ගුවන් විදුලි **MON** යයි පත්තරයි රජයට බැහැලා වැඩ. උදේ ඉඳන් රෑ වෙනකල්ම ආණ්ඩුවට ආ වැඩීම තමයි කරන්නෙ. ඒක හැම ඡන්දෙකදිම ලංකාවෙ එන හැම රජයක්ම කරන දෙයක්. ඒගතිය ටිකක් හරි අඩුවෙන් තිබුණෙ මට මතක හැටියට මැතිනියගෙ කාලෙ. ඒකාලෙ ටෙලිවිෂන් තිබුණෙ නැහැ. හොඳටයි නරකටයි සේරටම තිබුණෙ රේඩියෝ එක විතරයි. ඒ නිසාම දැන් වගේ මෙච්චර මනස්ගාත විකාර දකින්න ලංකාවෙ මිනිස්සුන්ට ඒ යුගයෙ අවස්ථා වක් ලැබුණෙ නැහැ. ඒක වාසනාවක්! අදට වඩා හොඳ ශීලාචාර මාධ්‍යයක් ඒ කාලෙ තිබුණා.

**කුජදා** - ශ්‍රීලංකා ගුවන් විදුලියෙ දැනට ඉන්න ලොක්කා **TUE** වන හඩ්සන් සමරසිංහ, රේඩියෝ එකෙන් කරන මැතිවරණ විග්‍රහයක් ඉන්ද්‍රජිත් අයියා අපට යූ ටියුබ් එකෙන් ඊමේල් කරලා එවලා තිබුණා. මොනවද ඒ හඩ්සන් පාවිච්චි කරණ අසික්කිත වචන. ඒ බාසාව රේඩියෝ එකට තියා, කෙනෙක් එක්ක නිකම් කතා කළොත් මූණට දමල අනින් හිතෙන වචන. අරූ, මූ, උන්, මුන්, මේ හැත්ත, ඔය ආදී වචන හඩ්සන්ගෙ කතාවෙ දිගටම තිබුණා. ජනාධිපතිවරයා හැල්ලුවට පත්වෙනවා, හඩ්සන්ලගෙ වාචාල කටවල් හන්දා. මෙයා ප්‍රේමදාස මහත්තෙයගෙ ගෝලයෙක්. ඒ මනුස්සයා හිටිය නම් හඩ්සන්ට කනට දෙකක් ගහවි ඔය බාසාවට.

**බුදදා-** ලංකාවෙ මේ ජනපතිවරණෙ දෙපැත්තෙන්ම මඩ **WED** ගහගන්නවා. ඡන්ද බාගන්න නොකරන දෙයක් නැහැ. ඉස්සර වගේම විරුද්ධ අපේක්ෂකයගෙ කොඩි කපනවා. පෝස්ටර් ඉරනවා. කාර්යාලවලට ගහනවා. ඔය වගේ මහ කුණු වැඩ. මෙහේ ඉන්න අපිට ඒවා නරක, පාදඩ වැඩ වගේ පෙනුණට ලංකාවෙ කාටත් ඒවා සාමාන්‍ය දේවල්. රූපවාහිනියේ තිබුණු ජනාධිපති මැතිවරණ වාදයක් අන්තර් ජාලයෙන් දැක්කා. ඒවායේ දෙපැත්තෙම කථිකයො කතාකරන්නෙ කෝලහලයකට ගිහිල්ලා වගේ. ඒ මූණුවල ලේ කළඳක් නැහැ. තරහෙන් දෙගොල්ලම කෑගහනවා. එක්කෙනෙකුට අනික් එක් කෙනා කතාකරන්න දෙන්නෙ නැහැ. ඒ වාදෙ මෙහෙය වන හාදයා ඊට වැඩිය හපන්. මිනිහ ඔහේ දෙපැත්ත බල බල ඉන්නවා. නිකම් කාලෙ කන වැඩසටහන් ඒව.

**ගුරුදා -** යුද්දෙ දිනුවෙ කවුද කියන එක යුද්දෙන් පස්සෙ **THU** ප්‍රශ්නයක් වුණා රජයටයි ජෙනරාල් ෆොන්සේකා තුමාටයි. ජයග්‍රහණයට අයිතිවාසිකම් කියන්නට යෑම ඉවරවුණේ මේ දෙපක්ෂයම රටේ නායකත්වයට තරඟ වැදිලා. ඇත්තටම කවුරු නිසාද දිනුවෙ කියන එක හැම දාම කතාබහ වෙන ප්‍රශ්නයක් වේවි. සරත් පොන්සේකා මහත්තෙයද? ආණ්ඩුවද? මෙතෙන්දි ආතර් මාම මෙහෙම ලියලා එවලා තියනවා. "දුවේ මේ යුද්දෙ දිනන්න හේතු වුණු එකම මිනිහා මට පේන විදියට වෙන කවුරුවත් නෙවෙයි, ප්‍රභාකරන්. ඒ යකා මේ යුද්ධෙ පටන්ගත්තෙ නැත්තම් මේ ගොල්ලන්ට දිනන්න යුද්ධයක් කොහේද තියෙන්නෙ? නේද? " කතාව ඇත්ත මාමෙ.

**කිවිදා -** ඔය යුද්ධෙ දිනපු ගෞරව ලැබිය යුතු කාටද කිය **FRI** ලා වාද කරන අතරෙ හොඳ වැදගත් පෝස්ටරයකුත් ලංකාවෙ තාප්පවල අලවලා තියනවා මම දැක්කා පත්ත රේකින්. ඇත්තට ඒක කාටවත් මඩගැහිල්ලක් නෙවෙයි. සාධාරණ ප්‍රශ්නයක් අහල තිබුණෙ. ඒකෙ රුවන්වැලි මහා සෑයෙ ලොකු කලර් පින්තූරයකුත් එක්ක මෙහෙම අහලා තිබුණා. "රුවන්වැලි මහා සෑය හැදුවෙ කවුද? දුටුගැමුණු රජතුමාද? මේසන් බාස්ද? " අර ප්‍රශ්නෙට පිළිතුර මට හිතෙන්නෙ අන්න එතන තියනවා.

**ශනිදා -** "රජයෙනුයි ජෙනරාල් ෆොන්සේකාගෙනුයි අපි **SAT** ඇහුවා අපේ ඉල්ලීම් පිළිගන්නවද කියලා.... රජය බෑ කිව්වා.... ජෙනරාල් හා කිව්වා. ඒ නිසා අපි ජෙනරාල්ට සපෝට් කරනවා..." දෙමළ සන්ධානෙ මන්ත්‍රී සම්බන්ධන් කියනවා. "දැන් මේ මෙතන ඉන්නෙ ඒ යුද්ධ කරපු සරත් පොන්සේකා නෙවෙයි.... වෙන සරත් පොන්සේකා කෙනෙක්...." කියලත් සම්බන්ධන් කිව්වා. එයාගෙ ඒ කතාව හරියට හරි. මේ ඉන්නෙ ඒ පොන්සේකා නෙවෙයි තමයි, දැන් අපට ඒක හොඳට තේරෙනවා කියලා තලව-කැලේ නැන්දම්මා ටෙලිපෝන් කරපු වෙලාව කිව්වා.